# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/133/2025 (PSC)

කුරුප්පු ආරච්චිගේ ජයානි ප්‍රිෂංගිකා
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.26**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුනතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, කේ.ඩී.එන්.දේශප්‍රිය මිය.

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

කේ.ඒ.ජයානි ප්‍රිෂංගිකා යන අය විසින්, 2025.06.16 දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඇයට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා වලින් නිදහස් කර, ඇය වෙත නිකුත් කරන ලද විනය නියෝගය අවලංගු කර දෙන ලෙසටය. 2023.02.15 දිනැති ලේඛනය මගින් අභියාචක වෙත, චෝදනා තුනක් ඉදිරිපත් කර ඇත. එම චෝදනා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් විසින් නිකුත් කර ඇති 2023.02.15 දිනැති ලේඛනයේ සඳහන් වේ. ඉදිරිපත් කර තිබූ චෝදනා 03 අතරින්, 02 වන චෝදනාවෙන් අභියාචක නිදොස් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් නිකුත් කරන ලද, 2024.09.06 දිනැති ලිපියේ ඒ බව සඳහන් කර ඇත. 1 සහ 3 චෝදනා වලට අභියාචක වරදකරු කර

ඇත. ඒ අනුව යමින්, ඇයගේ වැටුප් වර්ධක එකක් විලම්භනය කරමින්, විනය නියෝගයක් නිකුත් කර ඇත.

ඉහත අධ්‍යාපන සේවා කමිටුවේ තීරණයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කර තිබූ එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරමින්, අධ්‍යාපන සේවා කමිටුව විසින් ලබා දී ඇති තීරණය ස්ථිර කර ඇත. අභියාචකට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින්, පළවන චෝදනාවට පමණක් අභියාචක වරදකරු කර තිබුණද, අධ්‍යාපන සේවා කමිටුව විසින් එම තීරණය වෙනස් කරමින්, 1 සහ 3 චෝදනා දෙකටම අභියාචක වරදකරු බවට පත් කිරීමට තීරණය කර ඇත. තුන්වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, 01 සහ 02 චෝදනා දෙකෙන් එකකට හෝ චෝදනා දෙකටම, වරදකරු වන්නේ නම් 03 වන චෝදනාවට ද වරදකරු වන බවට සඳහන් කරමිනි. ඒ හේතුවෙන්, මෙම අවස්ථාවේ දී අභියාචක පළවන චෝදනාවට වරදකරු බවට පත්කර ඇති නිසා, 03 වන චෝදනාවට වරදකරු කර තිබීම දෝෂ සහගත නැත. ඒ අනුව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, අභියාචකට එරෙහිව නියම කර තිබූ 2 සහ 3 චෝදනා දෙකට අභියාචක වරදකරු බවට පත්කර ඇති තීරණයෙහි නිවරද්‍යතාවයයි.

ඉහත සඳහන් කර ඇති පරිදි, තුන්වන චෝදනාවට වරදකරු බවට පත් වන්නේ, පළවන චෝදනාවට වරදකරු වන්නේ නම් පමණි. එසේ හෙයින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති පළවන චෝදනාව සම්බන්ධයෙන් වන කරුණු සළකා බලන ලදි.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති පළවන චෝදනාව පහත සඳහන් වේ.

01. ***ඔබ, 2019 වර්ෂයේ නුගේගොඩ අනුලා විද්‍යාලයේ අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට වෙනත් පාසල් වලින් සිසුන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ දී, අධ්‍යාපන ලේකම්ගේ අංක 2008/17 චක්‍රලේඛයේ උපලේඛන අංක 02 හි සඳහන් ප්‍රතිපාදන වලට පටහැනිව පහත උපලේඛන 1 හි සඳහන් සිසුන් එක් අයෙකුට හෝ කිහිප දෙනෙකුට හෝ සියල්ලන්ටම හෝ ලකුණු ලබා දීමට උපදෙස් ලබාදීම හා/හෝ එකී ලකුණු ලබාදුන් ක්‍රමවේදය පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම හා/හෝ පාසල් ප්‍රධානියා ලෙස එම වැරදි ලකුණු ලබාදීම නිවැරදි නොකිරීම හෝ මගින්, අධ්‍යාපන ලේකම්ගේ අංක 2008/17 චක්‍රලේඛනයේ 4:6 වගන්ති උල්ලංඝනය කිරීමෙන් ආයතන සංග්‍රහයේ II***

***කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමුවන උපලේඛනයේ අංක 15 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

ඉහත කී චෝදනාව ඔප්පු කිරීම සඳහා සනාථ කළයුතු වන්නේ, අනුලා විද්‍යාලයේ අ.පො.ස (උසස් පෙළ) පන්ති වලට වෙනත් පාසල් වලින් ළමුන් ඇතුළත් කිරීමේ දී, පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දිය යුතු අන්දම දැක්වෙන චක්‍රලේඛනය අභියාචක විසින් උල්ලංඝනය කරමින් කටයුතු කර තිබේද යන්නයි. මෙහිදී විශේෂයෙන්ම සනාථ කළ යුතු වන්නේ, ඉහත කී අධ්‍යාපන ලේකම්ගේ අංක 2008/17 දරණ චක්‍රලේඛනයේ 4:6 වගන්තිය උල්ලංඝනය වී තිබේද යන්නයි. එකී අංක 4:6 දරණ වගන්තිය පහත දැක්වේ.

4:6 ***අ.පො.ස(උ.පෙ) පන්තිවලට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ඉහත 4:1 වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා උප වගන්ති වලට අනුව වෙන වෙනම ලේඛන ගත කොට, උපලේඛන අංක 2 හි සඳහන් ලකුණු දීමේ ක්‍රමය අනුව තෝරා ගැනීම කළ යුතුය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පදනම් කර ගෙන සකස් කර ඇත. එම උපදෙස් අනුව කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම පාසල් ප්‍රධානීන් වෙත පැවරේ.***

ඉහත කී ඡේදයේ සඳහන් අංක 2 දරණ උපලේඛනයේ සඳහන් පරිදි ලකුණු ලබා දිය යුතුව තිබුණි. එම උපලේඛනය පහත දක්වා ඇත.

***02. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමන්‍ය පෙළ විභාගයේ දී ලැබූ ප්‍රතිඵල***

| | |
|---|---|
| ***එක් විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා (A)*** | ***ලකුණු 06*** |
| ***එක් අධි සම්මාන සාමාර්ථයක් සඳහා (B)*** | ***ලකුණු 05*** |
| ***එක් සම්මාන සාමාර්ථයක් සඳහා (C)*** | ***ලකුණු 04*** |
| ***එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා (S)*** | ***ලකුණු 02*** |

***අතිරේක විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණක් බැගින් විෂයයන් 2 ක් සඳහා ලකුණු ලබා දිය හැකියි.***

***(උපරිම ලකුණු 50)***

***2008 අ.පො.ස(සා.පෙ) (නව ප්‍රතිසංස්කරණයට අනුව) විභාගය සඳහා විෂයයන් 09ක් ඇති බැවින්, එම ප්‍රතිඵලයන් සඳහා ඉහත පරිදි ම විෂයයන් 09ටම ලකුණු ලබා දී උපරිම 54ක් කර ගත යුතුය.)***

***විෂය සමගාමී කටයුතු***

***මේ යටතේ එක් ශිෂ්‍යයකුට ලකුණු ලබා ගත හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය/අනුමත කර විෂය සමාගමී කටයුතු 03ක් සඳහා පමණි. ලකුණු දිය යුත්තේ ජාතික හෝ පළාත් යන මට්ටම් දෙකින් එක් මට්ටමකට පමණි.***

| ලැබූ ස්ථාන | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
|---|---|---|---|
| ජාතික මට්ටම | ලකුණු 5 | ලකුණු 4 | ලකුණු 3 |
| පළාත් මට්ටම | ලකුණු 3 | ලකුණු 2 | ලකුණු 1 |

**(උපරිම ලකුණු 15)**

***ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළ වන සියලුම ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුයි.***

මෙම උපලේඛන අනුව ලකුණු ලබාදීමේ දී, පහත සඳහන් කරුණු අනුවද කටයුතු කර තිබිය යුතුය. එනම්

I. අයදුම්කරු පදිංචි ප්‍රදේශය,

II. අ.පො.ස(සා.පෙ) විභාගයේ ප්‍රතිඵල මත ලකුණු ලබාදීම,

III. අතිරේක විෂයයන් සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය යන කරුණය.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාව වන්නේ ඉහත කී ලකුණු ලබාදීමේ ක්‍රමය නොසළකා හරිමින්, අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දී ඇති බවයි. මෙම කරුණු සම්බන්ධයෙන් දෙපාර්ශවයම විසින්ම ඉදිරිපත් කර ඇති සියළුම කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

ඉදිරිපත් කර තිබූ චෝදනාව වන්නේ, ඉහත කී චක්‍රලේඛනය අනුව ලකුණු ලබා නොදෙමින්, අයදුම්කරුවන් වෙත ලබා දී ඇති මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 100 වන ලෙසට සඳහන් කර තිබූ බවයි. එසේ ලකුණු 100ක් ලබාදී තිබීම අභියාචක හබ කරන්නේ නැත. ඉදිරිපත් ව සිටි අයදුම්කරුවන් සම්බන්ධයෙන්, ඉහත කී චක්‍රලේඛනය අනුව ලැබිය යුතු ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2026.02.17 දිනැති වාර්තාව පරිදි, 79ක් විය යුතු නමුත්, එම ප්‍රමාණය ලකුණු 100ක් ලෙසට සඳහන් කරමින් කටයුතු කර තිබීම වැරදි සහගත බවට වන කරුණ අභියාචකට එරෙහිව ඉදිරිපත් වේ. එම ක්‍රමවේදය, එසේ සිදුව ඇති බව, දෙපාර්ශවයම විසින්ම පිළිගෙන ඇත. එසේ නම් බැලූ බැල්මට චක්‍රලේඛනයෙන් බැහැරව අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දී ඇති බව පෙනී යයි. එසේ නම් පළවන චෝදනාවට අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් දක්නට නැත.

මේ සම්බන්ධයෙන් අභියාචක කරුණු ඉදිරිපත් කරමින් දන්වා සිට ඇත්තේ, ඉහත කී ආකාරයට ලකුණු 100ක් ලබාදීමේ ක්‍රමවේදය, දීර්ඝ කාලයක් තිස්සේ පවත්වා ගෙන ගොස් තිබූ බවයි. අභියාචක වෙනුවෙන් අවසන් වරට ඉදිපත් කර ඇති 2026.01.26 දිනැති ලිඛිත දේශන වල සඳහන් කර ඇත්තේ, අනුලා විද්‍යාලයේ පමණක් නොව, දිවයිනේ ජනප්‍රිය පාසල් වල පවා ඉහත කී චක්‍රලේඛනයේ සඳහන් ක්‍රමවේදයට පරිබාහිරව යමින්, මුළු ලකුණු සංඛ්‍යාව 100 වන

සේ දක්වමින්, ලකුණු ලබා දී ඇති බවයි. ඊට අමතරව, මේ අන්දමට ලකුණු 100 දක්වා වැඩි කිරීම හේතුවෙන් කිසිදු අයදුම්කරුවෙකුට හානියක් හෝ අගතියක් සිදු වී නොමැති බවටද කරුණු ඉදිරිපත් කර ඇත.

තවද, අභියාචක වෙනුවෙන් කරුණු දක්වා ඇත්තේ, මෙම තීරණය අභියාචක විසින් පමණක් ගෙන ඇති තීරණයක් නොව, නියෝජ්‍ය විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂක කමිටුවක් මඟින් ගෙන ඇති තීරණයක් බවයි. ඉහත කී කරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද හබකර නැත.

මෙම කරුණු සළකා බැලීමේ දි පෙනී යන්නේ, ඉහත කී චක්‍රලේඛනයේ සඳහන් උපලේඛනයේ දක්වා ඇති අන්දමට ලකුණු ලබා නොදී, මුළු ලකුණු සංඛ්‍යාව 100 දක්වා වැඩි කිරීමෙන් කිසිදු පාර්ශවයකට අගතියක් හෝ හානියක් සිදුවී නොමැති බවයි. එම හේතුවෙන් තෝරා නොගත් ළමුන්ට හෝ කිසිදු බලපෑමක් සිදුවී නැත. එයින් පෙනී යන්නේ, චක්‍රලේඛනයේ විධිවිධාන අනුව කටයුතු කලා සේ සළකමින් ළමුන් ඇතුලත් කර ගැනීමේ දී ලකුණු 100 ලබාදීම, පරිපාලනමය වශයෙන් හා සාමූහිකව ක්‍රියාකරමින් ගෙන ඇති තීරණයක් බවයි.

අදාළ චක්‍රලේඛනයේ සඳහන් ආකාරයට ක්‍රියා නොකර සිටීමෙන්, අනිසි ප්‍රතිපළයක් හෝ ලැබී නැත. මෙම තත්ත්වය දීර්ඝ කාලයක් තිස්සේ බොහෝ ජනප්‍රිය පාසල් මඟින්ද අනුගමනය කර ඇත. එයින් පෙනී යන්නේ කිසියම් චක්‍රලේඛනයක උපදෙස් කඩකර ඇතත්, එම කඩකිරීම් නොසළකා හරිමින් කටයුතු කිරීම පුරුද්දක් ලෙස පවත්වා ගෙන ගොස් ඇති බවයි. (**It has become a practice in breach**) මෙවැනි තත්ත්වයක් උද්ගත වූ විට මෙම වරද සිදුකළ තැනැත්තා වෙත දඬුවම් නියම කිරීමේ දී එම කරුණු විශේෂයෙන් සළකා බැලිය යුතු වනවා ඇත.

මෙම තත්ත්වය සනාථ කිරීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන වලදී, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුලා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති වෙත වෙනත් අවස්ථාවකදී, නිකුත් කරන ලද 2024.10.29 දිනැති ලිපියක පිටපතක් ඉදිරිපත් කර ඇත. එම ලිපියේ සඳහන් වන්නේ, මෙම වරද සිදුකරන ලද අනුලා විද්‍යාලයේ එවකට නියෝජ්‍ය විදුහල්පතිනිය වී සිටි අයට "**අවවාද කිරීමක්**" පමණක් දඬුවමක් ලෙස පනවා ඇති බවයි.

ඉදිරිපත් වී ඇති කරුණු අනුව වරද සිදුකිරීමේ දී, අභියාචක විසින් ඇයගේ ස්වාධීන මතයක් මත ගනු ලැබූ තනි තීරණයක්, ඒ සඳහා බලපා නැත. මෙම කරුණට අදාළ තීරණය ගෙන ඇත්තේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 04ක් විසින් කරන ලද අධීක්ෂණය මත, පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ප්‍රතිඵලයක් වශයෙනි. නමුත් මෙම කරුණට අදාළව චෝදනා ඉදිරිපත් කර ඇත්තේ

අභියාචකට එරෙහිව පමණක් බවට ඇය විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එය එසේ වුයේ නම්, එයද වැරදි සහගත ක්‍රියා මාර්ගයක් වනවා ඇත.

මෙහිදී සළකා බැලිය යුතු තවත් කරුණක් වන්නේ, විධිමත් විනය පරීක්ෂණය පවත්වන ලද ඒක පුද්ගල විනිශ්වය සභාව විසින් ඉදිරිපත් කරන ලද පිටු 33කින් සමන්විත ඔහුගේ වාර්තාවේ අවසාන ඡේදයේ සඳහන් කරුණු කෙරෙහි විනය බලධාරීන් කිසිදු අවධානයක් යොමු කර නොමැති වීමයි. එම ඡේදයේ ඔහු මෙසේ සඳහන් කර ඇත.

> ***"චූදිත නිලධාරිනිය අංක 01 දරණ චෝදනාව අනුව අධ්‍යාපන ලේකම්ගේ 2008/17 චක්‍රලේඛයේ 4:6 වගන්තිය උල්ලංඝනය කිරීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ රාජ්‍ය සේවකයින් විසින් සිදුකරනු ලැබිය හැකි වැරදි පිළිබද 1 වන උපලේඛනයේ අංක 15 දරණ වරද සිදුකර ඇති බව සත්‍ය බවට ඔප්පු වී ඇත. ඇයගේ මෙම ක්‍රියාව හේතුවෙන් පාසලට හෝ රජයට හෝ සිසුන්ට හෝ සිසුන්ගේ දෙමාපියන්ට හෝ කවරකුට හෝ අගතියක් සිදුවී ඇති බවට කිසිදු සාක්ෂියක් ලැබී නැත.***
>
> ***තවද චූදිත නිලධාරිනිය විසින් මෙම වරද සිදුකිරීම තුලින්, අවිනයක් හෝ, අනිසි හැසිරීමක් හෝ අදක්ෂකමින් කටයුතු කර ඇති බවට හෝ අකාර්යක්ෂමතාවයක් පෙන්වා ඇති බවට හෝ අවංකභාවය නොමැතිව (එනම් වංක බැවින් යුතුව) කටයුතු කර ඇති බවට හෝ කිසිදු සාක්ෂි හෝ කරුණු හෝ ඉදිරිපත්ව නැත. ඇයගේ නොසැලකිල්ල හෝ අනවධානය මෙම වරද සිදුවීමට හේතු කාරක වී ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් දණ්ඩන නියෝග පැනවීමේ දී මේ ගැන අවධානය යොමු කිරීම මැනවැයි නිර්දේශ කරමි.***"

ඉහත කී නිර්දේශ කෙරෙහි විනය බලධාරීන්ගේ අවධානය යොමුකර තිබුනේ නම්, අභියාචකගේ ඉදිරි උසස්වීම් යනාදි වෘත්තිමය පදනමට දීර්ඝ කාලීනව බලපානු ලබන, දැනට ලබා දී ඇති දඩුවම නියම කරනු නොලැබිය යුතුව තිබුණි.

ඉහතින් සඳහන් කර ඇති පරදි, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ, 1 සහ 3 චෝදනා වලට අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් නොමැති බවට තීරණය කරමු.

කෙසේ වෙතත් ඉහත සඳහන් කර ඇති කරුණු සළකා බලා, මෙහිදි අභියාචකට නියම කර ඇති වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීම යන දඩුවම, බරපතල දඩුවමක් බවට තීරණය කරමු.

කිසියම් විනය පරීක්ෂණයකින් අනතුරුව පුද්ගලයෙකු වරදකරු බවට පත් කිරීමෙන් පසුව, දඬුවම් නියම කිරීමේ දී සළකා බැලිය යුතු කරුණු මොනවාද යන්න, මෙම විනිශ්චය අධිකාරය විසින් 225/2023(PSC) දරණ අභියාචනය සම්බන්ධයෙන්, 2026.02.19 දිනැතිව නිකුත් කරන ලද නියෝගයේ, දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත.

ඉහත කී හේතූන් සළකා බලා, අභියාචක වෙත පනවා ඇති වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීම යන දඬුවම ඉවත් කරමු. එම නියෝගය ඉවත් කරමින්, ඇය වෙත නිකුත් කර ඇති 1 සහ 3 චෝදනා, ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 2 උපලේඛනය යටතට ගැනෙන චෝදනා බවට පත්කරමින්, ඇය වෙත ආයතන සංග්‍රහයේ 24:2 වගන්තිය යටතට ගැනෙන සුළු දඬුවමක් ලෙස සළකනු ලබන, "***අවවාද කිරීමක්***" යන සුළු දඬුවම පමණුවමු.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ අභියාචනයට ඉඩදෙමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කර, මෙම විනිශ්චය අධිකාරය වෙත දැනුම් දෙන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තවදුරටත් නියම කරමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-